<u>**ලංසු සඳහා ආරාධනයයි**</u>

<u>**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර**</u>

<u>**පරිගණක, ලැප්ටොප්, බහුවිධ මුද්‍රණ යන්ත්‍ර, දෘෂ්‍ය උපකරණ, හා ශ්‍රව්‍ය උපකරණ සැපයීම**</u>

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙසින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා පරිගණක, ලැප්ටොප්, බහුවිධ මුද්‍රණ යන්ත්‍ර, දෘෂ්‍ය උපකරණ, හා ශ්‍රව්‍ය උපකරණ සැපයීම සඳහා සුදුසුකම් සහිත හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

| ලංසු අංකය | විස්තර | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|---|
| ANU/DIST/2/15/1/B/16 | පරිගණක | 23 | 230,000.00 ( 2026.02.20 දින දක්වා වලංගු) |
| | ලැප්ටොප් | 23 | |
| | බහුවිධ මුද්‍රණ යන්ත්‍ර | 23 | |
| | දෘෂ්‍ය උපකරණ | 23 | |
| | ශ්‍රව්‍ය උපකරණ | 23 | |

ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.

1. පහත සඳහන් ලිපිනයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ආපසු නොගෙවන රු.3,500.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට 2025 දෙසැම්බර් 04 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව.9.00 ත් ප.ව.3.00 අතර ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛණ සම්පූර්ණ කට්ටලයක් ලබා ගත හැකිය.

2. ලංසු 2025 දෙසැම්බර් 05 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී නිල කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. 2025 දෙසැම්බර් 05 දින පෙ.ව. 10.30 ට පහත සඳහන් ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන් හෝ නියෝජිතයින් ඉදිරිපිට දී ලංසු විවෘත කරනු ලැබේ. සෑම ලංසුවක් සමඟම ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවක් මගින් ඉහත සඳහන් කර ඇති පරිදි ලංසු සුරක්ෂණයක් 2026.02.20 දින දක්වා වලංගු වන සේ ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය මුදලින් ගෙවීමට ලංසුකරු කැමැත්තේ නම් එය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ලබාගත් ලදුපත ලංසුව සමඟ අමුණා එවිය හැකිය.

3. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින්(දුරකථන 025-2227018) ලබා ගත හැකිය. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

කේ.ජී.ආර්.විමලසූරිය,
සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.
2025.11.21